දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : ..33.../2014

මගේ අංකය : ඞී1/10/85(IV),

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09.

2014/08/13.

"වැදගත් "

මූලස්ථානයේ සියළුම මාණ්ඩලික නිලධාරීන්;

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ

සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

<u>විදේශ නිවාඩු අනුමැතිය ලබා ගැනීම</u>

පුද්ගලික විදේශ සංචාර, රාජකාරී විදේශ සංචාර ඇතුළු විදේශ ගමන් සඳහා විදේශ නිවාඩු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේ දී, අනුමැතිය ලබා දීම සඳහා ප්‍රමාණවත් කාල සීමාවක් නොමැති ව අයදුම්පත් ඉදිරිපත් කිරීම නිසා අනුමත කිරීමේ දී ගැටළුකාරී තත්ත්වයකට මුහුණ පෑමට සිදු වී ඇත.

02. එබැවින් මින් ඉදිරියට විදේශ නිවාඩු අනුමැතිය සඳහා මූලස්ථානයට ඉදිරිපත් කිරීමේ දී විදේශ ගත වීමට මාසයකට පෙර, අධිකාරීගේ නිර්දේශ සහිතව මූලස්ථානයට ඉදිරිපත් කළ යුතු බව ද දන්වමි. එසේ අයදුම් කිරීමට අපොහොසත් වුවහොත් අදාළ විදේශ නිවාඩු අයදුම්පත් අනුමැතියට ඉදිරිපත් නොකර ආපසු එවීමට කටයුතු කරන බව දන්වමි.

03. එසේම විදේශ නිවාඩු අනුමැතියකින් තොරව විදේශ ගත නොවන ලෙස ද, විදේශ නිවාඩු අනුමැතියකින් තොරව විදේශ ගත වුවහොත් සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කරන බවද වැඩිදුරටත් දන්වමි.

04. මෙම චක්‍රලේඛය ලැබුණු බව දන්වා එවිය යුතුය.

චන්ද්‍රරත්න පල්ලේගම

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.